# සංඥාපනය

මෙම පොත කියවීම සඳහා අංක ගණිතය හා මූලික ජ්‍යාමිතිය ඇතුළුව ගණිතය පිළිබඳ සුළු අවබෝධයක් පමණක් පාඨකයාට තිබීම සෑහේ. මෙහි එන ගැටළු සුළු සංඛ්‍යාවක් පමණක් විසඳීමේදී මූලික ගණිතමය සමීකරණ පිළියෙළ කිරීමට හා ඒවා විසඳීමට සිදුවේ. ඒ කෙසේ වෙතත් මෙම පොත මිශ්‍ර ප්‍රහේලිකා හා ගණිතමය ක්‍රීඩාවේ පැටළිලි සහගත සුත්‍රවල සිට, ගැණීමේ හා මිණීමේ ව්‍යවහාරික එමෙන්ම ප්‍රයෝජනවත් ක්‍රම දක්වා වූ විවිධ ආකාරයේ ගැටළුවලින් සමන්විතය.

1

# නුතක් තේරවිලි සමග ඔබේ ආධාරය





## 1. පිට්ටනිය මැද ලේනා

''අද උදේ මම ලේනෙක් එක්ක හැංගිමුත්තන් සෙල්ලම් කළා'' විවේකාගාරයේ උදේ තේ පානය සඳහා වාඩි වූ විවේකාලාභීන්ගෙන් එකෙක් පැවසීය. ''මේ ළඟ කැලේ තියෙන රවුම් එළිමහන් පිට්ටනිය දන්නවද? ඒ පිට්ටනිය මැද එකම ගහයි තියෙන්නේ. ලේනා හැංගුනේ ඒ ගහ පිටිපස්සේ. කැලේ සිට පිට්ටනියට එනකොටම මම දැක්කා ලේනා ගහේ කඳ පිටිපස්සේ සිට උගේ දිලිසෙන ඇස්දෙකෙන් මා දිහා බලාගෙන ඉන්නවා. මම දැක්කේ උගේ මුහුණ විතරයි. ලේනා හොඳ හැටි බලාගන්න මම ඌට කිට්ටු නොවී පිට්ටනිය අයින දිගේ ගහ වටේට ගියා. හතර වතාවක්ම මම ගහ වටේ ගියා. මම දැක්කේ ලේනාගේ මුහුණ විතරයි. කොහොමටත් මට ලේනා වටේ යන්ට බැරි වුණා.''

''එහෙත් ඔබ කිවා නේද ගහ වටේ හතර වතාවක් ගියා කියලා'' තේ මේසයට වාඩිවී සිටි එකෙක් විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

''ගහ වටේ මිස ලේනා වටේ නොවෙයි.''

''ලේනා හිටියේ ඒ ගහේ?''

''ඉතින් ?''

''ඒ කියන්නේ ඔබ ලේනා වටේත් කැරකුණා.''

''හොඳයි කැරකුණා! ලේනාගේ පිට එකවතාවක්වත් දැක්කේ නැහැ.''

''පිට මොනවටද? ලේනා හිටියේ මැද. ඔබ වටේට කැරකුණා. ඒ කියන්නේ ඔබ ලේනා වටේත් කැරකුණා.''

''කොහොමටත් එහෙම නොවෙයි. මම ඔබ වටේ යනවා කියලා හිතන්න. ඔබත් හැම වෙලාවේම මට මූණ පා ඉන්නවා. ඔබේ පිට මට පෙනෙන්නේ නැහැ. ඔබ හිතන්නේ මම ඔබ වටේ කැරකුණා කියලද?''

''ඇත්ත වශයෙන්ම එහෙම තමා. වෙන කොහොමද?''

''එක වතාවක්වත් ඔබේ පිට පැත්තට යන්නේ නැති නම්, ඔබේ පිට දකින්නේ නැති නම්, මම ඔබ වටේ කරකැවෙනවාද?''

''පිටේ තේරුමක් නැහැ! ඔබ මා වටේ රවුමක් කරකැවිලා හිටපු තැනටම ආවා. ඒනිසයි ඔබ මා වටේ කරකැවුණා කියන්නේ. මගේ පිට දැකීම නොවෙයි.''

''ඒ කොහොමද? වස්තුවක් වටේ කරකැවෙනවා කීමේ තේරුම කුමක්ද? මා හිතන හැටියට එයට එකම තේරුමයි දෙන්න පුළුවන්: එනම් වස්තුව සෑම දිසාවකින්ම බලාගත හැකි වන සේ අනුක්‍රමයෙන් එය වටා යාමයි. සත්‍යය එය නෙවද මහාචාර්‍ය තුමා'' වාදකරන්නා තේ මේසයට වාඩි වී සිටි මහල්ලෙකුගෙන් විචාළේය.

''වාදය කෙරෙන්නේ ප්‍රධාන වශයෙන් වචන පිළිබඳවයි'' විද්‍යාඥයා පිළිතුරු දුන්නේය. ''මෙ වගේ අවස්ථාවලදී මුල සිටම පටන්ගත යුතුයි: අපි වචනවල අර්ථය ගැන එකඟත්වයකට පැමිණිය යුතුයි. ''වස්තුවක්